සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# අවසාන වාර පරීක්ෂණය 2015

7 ශ්‍රේණිය

# නර්තනය

කාලය පැය 02 යි.

නම/ විභාග අංකයඃ

## I කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- වඩාත් ම නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 පා සරඹ නර්තනයේ ඇති වැදගත්කම වන්නේ,

(1) නිසි පරිදි තාලය හඳුනා ගැනීම. (2) අත්වල හැඩය නිසි අයුරින් ඉගෙනීම.
(3) අත් හා හිස නිසි පරිදි තබා ගැනීම. (4) පාද නිසි අයුරින් හුරු කර ගැනීම.

02 ''තා තෙයි....... තා තෙයියත් තාම්'' මෙම සරඹය වන්නේ,

(1) හතරවන පා සරඹය (2) පස්වන පා සරඹය
(3) හත්වන පා සරඹය (4) අටවන පා සරඹය

03 තනි තිතේ ප්‍රභේද ගණන,

(1) තුනකි. (2) හතරකි. (3) දෙකකි. (4) හයකි.

04 ''දොං ජිං ජිං තකට දොංතක'' මෙම බෙර පදය අයත් වන්නේ,

(1) සුළු මැදුම් දෙතිත (2) මහ තනිතිත (3) මැදුම් මහ දෙතිත (4) සුළු මහ දෙතිත

05 ආධුනික නර්තන ශිල්පියා පා සරඹ හුරු වන්නේ,

(1) දණ්ඩි කඳ යොදා ගෙන (2) කටක යොදා ගෙන
(3) කරලිය යොදා ගෙන (4) තාලම්පට තම අතින් ගසමින්

06 උඩරට නර්තන ප්‍රචලිත ප්‍රදේශයක් නොවන්නේ,

(1) මහනුවර (2) බදුල්ල (3) කුරුණෑගල (4) කුරුවිට

07 ''එගොඩ ගොඩෙත් රත්තරං'' මෙම රබන් පදයට උචිත තාලය වන්නේ,

(1) මාත්‍රා 3 තිත (2) මාත්‍රා 4 තිත (3) මාත්‍රා 3 + 4 තිත (4) මාත්‍රා 2 තිත

08 නැළවිලි කවි හා නෙළුම් කවි අයත් වන්නේ,

(1) ගැමි ගී වලට (2) සැණකෙලි ගී වලට (3) නළු ගී වලට (4) ශාන්තිකර්ම ගී වලට

09 දඬු බෙරය,

(1) උඩරට වාද්‍ය භාණ්ඩයකි. (2) පහතරට වාද්‍ය භාණ්ඩයකි.
(3) ආදේශ භාණ්ඩයකි. (4) සබරගමු වාද්‍ය භාණ්ඩයකි.

10 උඩරට නැටුම් සම්ප්‍රදායේ ප්‍රධාන ඇඳුම් කට්ටලය වන්නේ,

(1) නෛඅඩි ඇඳුම් කට්ටලය (2) වෙස් ඇඳුම් කට්ටලය
(3) තෙල්මේ ඇඳුම් කට්ටලය (4) පබළු ඇඳුම් කට්ටලය

(ල. 10)

● පහත දී ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

11 පස්වන ගොඩසරඹයේ සරඹ නාමය වන්නේ ..............................................................................

12 පහතරට ප්‍රධාන ශාන්ති කර්මය වන්නේ ..............................................................................

13 හනුමා වන්නම ගායනා කරන්නේ .............................................................................. තිතටය.

14 උඩරට වන්නමක් අවසාන වන්නේ .............................................................. නර්තනය කිරීමෙනි.

15 සුළඟේ ආධාරයෙන් වැයෙන භාණ්ඩයක් ලෙස ........................................ හඳුනාගත හැක.

(ල.10)

● පහත ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද වරහන් තුළ යොදන්න.

16 නර්තනයේ මූලික ඉරියව්ව නමස්කාරයයි. ( )

17 මන්ඩියට සිටීමේ දී නියමිත දුර මිටි රියනකි. ( )

18 වන්නමක් යනු යම් කිසි වස්තුවක් පිළිබඳ වර්ණනා කිරීමකි. ( )

19 ඇහැල මලින් ගස් පිරිලා ගීතය ඇතුලත් වන්නේ නරි බෑනා නාටකයේ ය. ( )

20 'තත් ජිත් තොං තං තා' පළමු පා සරඹයේ හමාර පදයයි. ( )

21 මුවා සහ අලියා නර්තනයට උචිත සත්ව චරිත වේ. ( )

22 දෙවොල් මඩුව සබරගමු නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන ශාන්ති කර්මයයි. ( )

23 ගැමි ගායනා ඉතා සංකීර්ණය. ( )

24 පාද සමඟ දෑත් හුරුවන්නේ වන්නම් නැටීමෙනි. ( )

25 දොං ජිජි ගත බෙර පදය මාත්‍රා 02 තාලයට අයත් ය. ( )

(ල.10)

## II කොටස

● ප්‍රශ්න 04 කට පමණක් පිළිතුරු සපයන්න.

01 මාත්‍රා $2 + 3$ අදාළ වන්නමක කවියක් හා කස්තිරම අඩව්ව ලියා දක්වන්න.

02 (1) පා සරඹ යනු මොනවාදැයි හඳුන්වන්න.

(2) පා සරඹ හමාර පදය ලියා දක්වන්න.

03 (1) මාත්‍රා 3 තාලයට රබන් පදයක් ප්‍රස්ථාර කරන්න.

(2) ලීකෙළි නැටුමේ එන කවියක් ලියන්න.

04 (1) පහතරට ප්‍රචලිත නර්තන සම්ප්‍රදාය ගැන කෙටියෙන් විස්තර කරන්න.

(2) එහි ප්‍රධාන වාද්‍ය භාණ්ඩය චිත්‍රයට නඟන්න.

05 (1) දෙතිතේ ප්‍රභේද නම් කරන්න.

(2) උදාහරණ බෙර පද ප්‍රස්ථාර කර පෙන්වන්න.

06 ඔබ පාසලේ සංවිධානය කළ විවිධ ප්‍රසංගයේ තිබූ නර්තන අංග පිළිබඳ විස්තර කරන්න.

(ල.50)

The National e-Learning Portal for The General Education